# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය SINHALA

India's National Spiritual Newspaper ₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XX YEAR OF OUR LORD JESUS CHRIST, 2026 JUNE Issue No. 07


## ශුද්ධවූ බයිබලය

**(යෙසායා 54:13-17)**

13. නුඹේ සියලු දරුවෝද ස්වාමීන්වහන්සේ විසින් උගන්වනු ලබන්නෝ වෙති, නුඹේ දරුවන්ගේ සමාදානයද මහත් වන්නේය.

14. නුඹ ධර්මිෂ්ඨකමෙන් පිහිටවනු ලබනවා ඇත. නුඹ බලහත්කාරයෙන් දුරුව භය නැතුව සිටින්නෙහිය., භීතියෙනුත් දුරුව සිටිනවා ඇත, එය නුඹට ළං නොවන්නේය.

15. මෙන්න, මාගේ සංඥාවක් නැතුව මනුෂ්‍යයන් රැස්වෙනවා ඇත. නුඹට විරුද්ධව එකතුවෙන කවුරු නුමුත් නුඹ නිසා වැටෙන්නෝය.

16. අඟුරුගින්න පිඹ නියම හැඩයට ආයුධයක් සාදන්නා වූ ආචාරියා මැවූවේ මමය, වනසීමට නාස්තිකාරයා මැවූවෙත් මමය.

17. නුඹට විරුද්ධව සාදන කිසිම ආයුධයක් සඵල නොවන්නේය. විනිශ්චයකිරීමට නුඹට විරුද්ධව නැගිටින සියලුම දිව් නුඹ විසින් වරදට පත්කරනවා ඇත. ස්වාමීන් වහන්සේගේ මෙහෙකරුවන්ගේ උරුමයත් මාගෙන් ඔවුන්ට ලැබෙන ධර්මිෂ්ඨකමත් එයාකාරයයි ස්වාමීන්වහන්සේ කියනසේක.

## දෙවියන්වහන්සේ ඔබට හානි කිරීමට කිසිවෙකුට ඉඩ නොදෙනු ඇත !

## GOD WILL NOT ALLOW OTHERS TO HARM YOU!

(සහෝදරී එන්ජලින්)



අපගේ ස්වාමිවූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මිහිරිමත් වූ නාමයෙන් ලොව පුරා සිටින්නා වූ අපගේ සියලුම සහෝදර සහෝදරියන්ට සුබ පැතුම් ගෙනෙමි. 'කැඳවීමේ ප්‍රතිරාවය' සඟරාව හරහා සමග වරක් ඔබ සමග සම්බන්ධ වීමට ලැබීම මට ඉමහත් සතුටක් ගෙන දෙයි. සාමයේ සහ සැනසිල්ලේ දෙවියන් වහන්සේ අප සැම දෙනාටම මග පෙන්වන සේක්වා!

මෑතකදී මා යකොබ්ගේ ජීවිත කතාව ගැන කියවමින් සිටියදී පහත සඳහන් පදයෙන් මම බෙහෙවින් සංවේදී වුනෙමි.

*'නුඹලාගේ පියා මා රවටා මාගේ කුලී දස වරක් වෙනස් කෙළේය. එහෙත් මම හිංසාවක් කරන්ට දෙවියන්වහන්සේ ඔහුට ඉඩ නොදුන් සේක.'' (උත්පත්ති 31:7)*

කොතරම් බලවත් සහතිකයක්ද! මෙම වචන මෙතෙක් කිරීමට පමණි - දෙවියන්වහන්සේ මාව විදවීමට මනුෂ්‍යයාට ඉඩ දුන්නේ නැත. මා සහ මගේ පවුල පරාජය කිරීමට සාතන් එවැනි සැලසීමක් ගෙන එයි. ඔබත් මෙම පොරොන්දුව ඉල්ලා සිටිනු ඇතැයි මා ප්‍රාර්ථනා කරමි .

දෙවියන්වහන්සේ මා හට හානියක් කිරීමට කිසිවෙකුටවත් ඉඩ දුන්නේ නැත.

3 වෙනි පිටුවට ...


Echo of His Call

Christian YouTube Channel!



Every day 2 minutes message by

Pr. S. Sam Selva Raj!

in English, Hindi Language - 1.00 A.M.,
in Tamil & Telugu Language - 2.00 A.M.

and

Tamil & English Message & Prayer

Sunday 8.30 A.M. & 6.00 P.M.

Please Subscribe if you are blessed! Share with whom you love & care!!

# ECHO OF HIS CALL - (Marching towards 60th year)

Estd. 1969

## from your dearly beloved brother...



"එවිට නුඹේ අටු බොහෝ ධාන්‍යයෙන් පිරෙන්නේය, නුඹේ මිදිකා යන්ත්‍රය අලුත් මිදිකා පානයෙන් ඉතිරෙන්නේය." (හිතෝපදේශ 3:10)



### OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

HON. EDITOR-IN-CHIEF
Rev. Dr. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.
EX MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
GENERAL MANAGER
Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM, MBA.
ADMINISTRATION
Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech, M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)
EDITORIAL BOARD
Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Rev. Dr. K.R. Rajasekaran
Rev. Dr. William Robert, Ph.D., DD, D.Lit.

EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858 95661 31858
E.MAIL
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.org
YOUTUBE CHANNEL
Echo of His Call

ස්වාමීන්වහන්සේ තුළ ප්‍රිය ප්‍රේමවන්තයෙනි,

අපගේ ස්වාමිවූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහිමාන්විත නාමයෙන් ඔබට සුබ පතමි!

වර්තමානයේ අපගේ නෙහෙමියා බයිබල් විද්‍යාලය, ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසල සහ සභාවේ සේවාවන් තුළින් බොහෝ අය අපගේ ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේව මුණගැසුණු බැවින් අපගේ දේව සේවයේ සෑම අංශයකම ආත්මික ලෙස විශාල අස්වැන්නක් අපි දකිමු.

නිවාඩු කාලීන බයිබල් පාසල අප්‍රියෙල් මස 14 සිට 21 දක්වා යන දිනයන්හිදී අපගේ ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලේදී පැවැත්වුණු අතර එයට බොහෝ දරුවන් සහභාගී විය. එහිදී බොහෝ සහෝදර සහෝදරියන් දරුවන්ට ඉගැන්වීමට සහ ඔවුන්ව ස්වාමීන් වහන්සේ වෙතට ගෙන ඒමට බොහෝ සේ කැප විය. එය මහත් ආශිර්වාදයක් විය.



(ශාන්ත පාවුළු මෙට්‍රොකියුලේෂන් පාසලේ ඉගැන්වීම් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය)



(අපගේ ශාන්තෝෂපුරම් සභාවේ ළමුන් සඳහා පැවැත් වූ නිවාඩු කාලීන බයිබල් පාසල)

මැයි මස 5 සිට 10 දක්වා යන දිනයන්හිදී චේපාක් හි අපගේ ප්‍රධාන සභාවෙහිද මැයි මස 11 සිට 17 දක්වා යන දිනයන්හිදී බලාජි නගර් සහ වේලච්චේරි යන අපගේ ශාඛා සභාවන්හිද නිවාඩු කාලීන බයිබල් පාසල් පැවැත්වීමට අපට හැකි විය.

Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) ▫ BIBLECOR - Postal Courses (3 languages) ▫ YouTube Ministry ▫ Online Courses ▫ Theological Correspondence Courses (2 languages) ▫ Church Planting ▫ Nehemiah Bible Colleges ▫ Gospel Printing Press ▫ Great Commission Partners ▫ St. Paul's Matriculation School ▫ Crusades ▫ Community Development

රජයේ නියෝගයට අනුව ජූනි මස දෙවන සතියේදී අපගේ පාසල නැවත ආරම්භ කරනු ලැබෙයි. විශේෂයෙන් අපගේ සිසුන්, ගුරු මණ්ඩලය, අනධ්‍යයන කාර්මණ්ඩලය හා  අධ්‍යාපන සේවය වෙනුවෙන් යාච්ඤා කරන්න.

අපගේ නෙහෙමියා  බයිබල් විද්‍යාලය 2026 ජූනි මාසයේදී නැවත ආරම්භ වෙයි.දෙමළ ඉංග්‍රීසි සහ හින්දි භාෂාවන්ගෙන් පාඩම් පිරිනමනු ලැබෙයි.

2025 සිට 2026  අධ්‍යයන වර්ෂය සඳහා පැවැත් වූ පංති මැයි මස 30වන දින අවසන් වන අතර ඒ සඳහා පවත්වන උපාධි ප්‍රධානෝත්සවය 2026 ජූලි මස 4වන දින සවස 5.00ට පුරසවල්කම්, රිදර්ඩ්ස් පාර, බලාර් කලම් නිලයම් හි M'R'C' ශාලාවේදී පැවැත්වෙයි.

කරුණාකර අපගේ සේවකයින් වෙනුවෙන් සහ දේව සේවයේ අවශ්‍යතා උදෙසා යාච්ඤා කරන්න. ඔබගේ අදහස් සහ යෝජනා අපි සාදරයෙන් පිළිගනිමු.
කරුණාව ඔබ සමඟ වේවා! ආමෙන්!

*In Christ Jesus, your servant,*

**Pr. S. Sam Selva Raj**
E.mail : sam@echoofhiscall.org

*1 පිටුවෙන්....*

මෙය වරක් තම සහෝදරයාට වංචා කළ පුද්ගලයෙකු පසුව තම පියාටද වංචා කළ බවත් ආශිර්වාදය ලබා ගැනීම සඳහා අන් අය රවටා ඇති බවත් පිළිබඳව ගැඹුරු කාරණයකි. එහෙත් යාකොබ් ගේ ජීවිතයේ අසාමාන්‍ය දෙයක් සිදුවිය. එනම්; මනුෂ්‍ය උපක්‍රම මගින් ආශිර්වාද කළ කෙනෙකුගෙන් සැබෑ ආශිර්වාදය සඳහා දෙවියන්වහන්සේ සමඟ පොරබදන මිනිසකු බවට ඔහු පරිවර්තනය විය.

යාකොබ් ගේ කතාව සැබැවින්ම ආකර්ෂණීයයි. එය රැවටිලිකාරයා රැවටුණු තැනැත්තා වෙත පැමිණෙන ගමනකි. වරක් ඉතා කපටි ලෙස ක්‍රියා කළ තැනැත්තා අවසානයේ නිහතමානී පුද්ගලයෙක් විය. යාකොබ් ගේ නීති, අසාර්ථකත්වයන් සහ අරගල නොතකා දෙවියන්වහන්සේ ඔහු සමඟ සිටි සේක. යාකොබ් ගේ වැරදි සහ අසම්පූර්ණ තේරීම් තිබුණත් දෙවියන් වහන්සේගේ  තම අරමුණ ඉටු කිරීම දිගටම කරගෙන ගියේය.

අප උත්පත්ති 31වන පරිච්ඡේදය  කියවන විටදී අපට ඒ තුළ බලවත් සත්‍යතාවයක් පෙනෙනු ඇත. දෙවියන් වහන්සේට තම සැලැස්ම ඉටුකර ගැනීමට ඕනෑම තත්ත්වයක් භාවිතා කළ හැකිය.

යාකොබ් දුවමින්, අරගල කරමින් හෝ නිදියන් ක්‍රියා කරමින් සිටියදී පවා, දෙවියන්වහන්සේ ඔහුගේ ඉරණම මෙහෙයවමින්, ආරක්ෂා කරමින් සහ නිපුණු කරමින් සිටියේය. කිසිවක් ඔහුගේ දෘෂ්ටියෙන් ගැලවී යන්නේ නැත.

අප යාකොබ් ගේ ජීවිතය දෙස ඉතා සමීපව බැලුවහොත් අපට පෙනෙන්නේ ඔහු දක්ෂ, බුද්ධිමත් සහ උපක්‍රමශීලී පුද්ගලයෙක් බවයි. ඔහු විවිධ තත්ත්වයන් හසුරා ගන්නේ කෙසේදැයි කියා දැන සිටියේය. ඔහු තම සහෝදරයා වන ඒසව් ගේ කුලුඳුල් කමේ අයිතිකාරයා නොවන බව දැන සිටි අතර, යාකොබ්ව විශ්වාස කළ තම පියාගේ ආශිර්වාදයද ඔහු වංචාවෙන් සොරකම් කළේය. ඔහු අනුග්‍රහය ලබා ගත්තේ ඔහුගේම උත්සාහයෙනි. පසුව ඔහු සැබෑ ආශිර්වාදය ලැබෙන්නේ මනුෂ්‍ය උත්සාහයෙන් නොව දෙවියන්වහන්සේ තුළින්ම පමණක්ය කියා තේරුම් ගත්තේය.



**I will not let You go**

ඉදින් දෙවියන්වහන්සේ ඔහුව මෘදු ලෙස නොව, ගින්නෙන් රත්තරන් මෙන් ඔප මට්ටම් කිරීමට පටන් ගත්හ. යාකොබ්ට; රැවටීම, දුෂ්කරතා, බිය සහ ගැටුම් අත්විඳීමට උන්වහන්සේ ඉඩ හැරියේ යාකොබ් කැළඹිලි සහිත ස්ථානයකට පැමිණ කැගසන තුරුය.

*"....ඔබ මට ආශිර්වාදකළොත් මිස නැත්නම් යන්ට නොහරිමි." (උත්පත්ති 32:26)*

මෙම පරිවර්තනය එක් රැයකින් සිදුවූවක් නොවේය. දෙවියන් වහන්සේ යාකොබ්ව දිගු හා දුෂ්කර ගමනක් හරහා ගෙන ගිය සේක.

එහෙත්, ඒ සියල්ල දෙවියන්වහන්සේගේ පාලනය යටතේ තිබුණේය. මිනිසුන්ගේ කුමන්ත්‍රණවලට යාකොබ්ව විනාශ කිරීමට උන්වහන්සේ ඉඩ දුන්නේ නැත. මන්ද උන්වහන්සේගේ සැලැස්ම යාකොබ්ගේ වැරදි වලට වඩා විශාල වූයේය.

## 1). මිනිසුන් කුමන්ත්‍රණය කරන විට දෙවියන්වහන්සේ ඒවා අවහිර කරයි!

යාකොබ්ගේ ජීවිතය තුළින් අපට ගැඹුරු පාඩමක් ඉගෙන ගැනීමට හැකිය. යාකොබ් ඔහුගේ පියා සහ සහෝදරයා රවටා ගැනීමෙන් පසු සිතනු ලැබුවේ; ඔහු තම අනාගතය සුරක්ෂිත කරගෙන ඇති බවයි. නමුත් දෙවියන් වහන්සේට අවශ්‍ය වූයේ; 'ආශිර්වාදයේ සැබෑ උල්පත මමයි' කියන ගැඹුරු සත්‍යතාවයක් ඉගැන්වීමටයි.



**Changed my wages ten times**

මෙම පාඩම ඉගෙන ගැනීම සඳහා, යාකොබ් තම මාමා වන ලාබන් සමඟ ජීවත් විය. මෙම ලාබන් ගැන දේව වචනයෙහි අපට මෙසේ සඳහන් කරයි;
*"නුඹලාගේ පියා මා රවටා මාගේ කුලී දස වරක් වෙනස් කෙළේය; එහෙත්ම මට*

හිංසාවක් කරන්ට දෙවියන් වහන්සේ ඔහුට ඉඩ නොදුන් සේක." (උත්පත්ති 31:7)

දෙවියන්වහන්සේ මෙසේ විමට යාකොබ් ගේ ජීවිතයෙහි ඉඩ දෙනු ලැබුවේ රුවටීම කෙබඳුද කියා තේරුම් ගැනීමටත් මිනිස් උත්සාහයට වඩා දෙවියන්වහන්සේ මත යැපීමට ඉගෙන ගැනීමටත්ය.

එහෙත් මෙවැනි ඉඩ හැරීමේදී පවා දෙවියන්වහන්සේ සීමාවන් නියම කළේය. ලාබාන්ට යාමට නොහැකි සීමාවක් තිබේය කියා යාකොබ් විශ්වාසයෙන් ප්‍රකාශ කළේය.

*''....එහෙත් මට හිංසාවක් කරන්ට දෙවියන් වහන්සේ ඔහුට ඉඩ නොදුන් සේක." (උත්පත්ති 31:7)*

මෙය බලවත් සත්‍යයක් හෙළිදරව් කරයි. දෙවියන් වහන්සේගේ දරුවන්ට එරෙහිව තිබෙන සෑම උපක්‍රමයකටම දිව්‍ය සීමාවක් ඇත.

මිනිසාගේ සෑම සැලැස්මකටම දෙවියන්වහන්සේ විසින් නියම කරන ලද සීමාවක් ඇත.

සෑම සටනක්ම උන්වහන්සේගේ අධිකාරිත්වය මගින් සීමා කරනු ලැබේ.

එම නිසා අද දක්වා අපගේ ජීවිතය ආරක්ෂා වී තිබේ. ස්වාමීන් වහන්සේට ප්‍රශංසා වේවා!

යෙසායා 54:17 හි අපට මෙසේ පවසයි:

*''නුඹට විරුද්ධව සාදන කිසිම ආයුධයක් සඵල නොවන්නේය ...."*

ආයුධ සැදිය හැකිය.

ප්‍රහාරයන් එල්ල විය හැකිය.

ඔබගේ පවුලට, විවාහයට, ව්‍යාපාරයට, සේවයට හෝ කැඳවීමට එරෙහිව සැලසුම් සකස් කළ හැකිය.

නමුත් අප ස්වාමීන්වහන්සේ සමග සමීපව ගමන් කරමින් උන්වහන්සේට විශ්වාසවන්තව සිටින්නේ නම් අපට එරෙහිව කිසිවක් සාර්ථක නොවනු ඇත.

මිනිසුන් අපිට විරුද්ධව කුමන්ත්‍රණය කරන විටදී දෙවියන්වහන්සේ ඒ සියල්ලම අවහිර කරනු ඇත.

## 2). දෙවියන්වහන්සේ අපට පෙනෙන දේවලින් සහ අපට නොපෙනෙන දේවලින් අපව ආරක්ෂා කරයි!

අපට දැකිය හැකි අනතුරු ගැන අප බොහෝ විට සාක්ෂි දරන නමුත් දෙවියන් වහන්සේ අපව ආරක්ෂා කරන නොපෙනෙන අනතුරු ගැන අප අමතක කරමු.



Animals were torn by wild beasts

ලාබාන් තම වැටුප වෙනස් කිරීම ගැන යාකොබ් කතා කළ නමුත් සැඟවුණු තර්ජන රාශියක් තිබුණි. ඔහු මෙසේ පවසනු ලැබිය:

*'වල් සතුන් විසින් ඉරා දමන ලද්දවුන් නුඹ වෙතට නොගෙනවුත් මම්ම ඒ අලාභය විඳිමි. දවාලේ හෝ රාත්‍රියේ හෝ සොරකම් කරන ලද්දවුන් නුඹ මා අතින් අය කෙළෙහිය.'' (උත්පත්ති 31:39)*

වන සතුන් රැළට පහර දුන්නොත් යාකොබ් අවදානමට ලක් විය. සොරුන්ගෙන් වන සතුන්ගෙන් සහ රාත්‍රියේ පැමිණෙන නොයෙකුත් ප්‍රහාර අනතුරු තිබුණි. නමුත් ස්වාමීන්වහන්සේ ඔහුගේ ජීවිතය ආරක්ෂා කළේය.

යාකොබ් සෑම අනතුරක්ම දැන සිටියේ නැත. නමුත් දෙවියන් වහන්සේ ඒ සියල්ලම අවහිර කළේය.

ස්වාමීන්වහන්සේ නිහඬව ජීවිතයේ සෑම සිදුවීමක් දෙසම බලා සිටියේය.

*''ස්වාමීන්වහන්සේ සියලු නපුරෙන් නුඹ ආරක්ෂා කරන සේක...'' (ගීතාවලිය 121:7)*

අපගේ ආදරණීයයන්ට සෑම අවස්ථාවේදීම අපට බලා ගැනීමට නොහැකිය. නමුත් දෙවියන් වහන්සේට එය කිරීමට හැකිය.

උන්වහන්සේ නොපෙනෙන්නා වූ අනතුරු කීයකින් අපව බේරාගෙන තිබේද?

අප කිසි දිනෙක දැක නොමැති උගුල් කීයක් තිබෙනවාද?

උන්වහන්සේගේ දයාව අපව ජීවත් කර තිබේ.

ගීතාවලිය 139 වන පරිච්ඡේදයෙහි අපට මතක් කර දෙන්නේ දෙවියන් වහන්සේ ගෙන් කිසිවක් සැඟවී නොමැති බවයි.

අපගේ යාච්ඤා වලට ප්‍රතිචාරය වශයෙන් කිසිවක් සිදු නොවන බව අපට හැඟෙන විටදී පවා දෙවියන්වහන්සේ උන්වහන්සේගේ කාලය තුළ තිරයේ පිටුපස සිට ක්‍රියා කරනු ඇත.

දෙවියන්වහන්සේ ක්‍රියා කරන ආකාරය අපට නොපෙනෙන විටදී පවා උන්වහන්සේ අපදෙස බලා සිටී.

....Contd. to page 6





ඉතා හදිසි දැනුම් දීමක්!

අපගේ ලිපිනය:

ECHO OF HIS CALL,
10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005, India
Cell: (+91) 98412 71858 / 98410 71858 E.mail: [illegible]@echoofhiscall.org

ඉදිරියේදී කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව තැපැල් මගින් යැවීමේදී නොවැළැක්විය හැකි බාධාවන් ඇතිවීමට හැකිය. එබැවින් ඔබට කිසිඳු බාධාවකින් තොරව කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව දිගටම ලබා ගැනීමට අවශ්‍ය නම්, කරුණාකර ඔබගේ නම, ලිපිනය, විද්‍යුත් තැපැල් සහ whatsapp අංකය සඳහන් කර ලිපියකින්, විද්‍යුත් තැපෑලෙන්, දුරකථන ඇමතුමකින් හෝ sms / Whatsapp පණිවිඩයක් හරහා ඉක්මනින්ම අප වෙතට ලැබෙන්නට සලස්වන්න.

ඔබගේ සහයෝගය අපට ඔබට හොඳින් සේවය සලසා දීමට උපකාරී වෙයි!

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

බෙදා ගැනීම (ගලාති 6:2)
උපකාර කිරීම (රෝම 12:13) සහ
පුබුදු කිරීම (2 තිමෝති 1:6)

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**ජූනි:19 -** 1969 වන වසරේ සිට කැදවීමේ ප්‍රතිරාවය සඟරාව නියමිත වේලාවට ප්‍රකාශයට පත් කිරීමට දෙවියන් වහන්සේ අඛණ්ඩව ආශිර්වාද කරන නිසා සහ විශ්වාසවන්තව උදව් උපකාර කළා වූ සහකාර සංස්කරුවන් නිසා, ස්තුති කරන්න.

**ජූනි:20-** නේවාසික සහ සන්ධ්‍යා නෙහෙමියා බයිබල් විද්‍යාලයට සිසුන් ඇතුළත් කර ගැනීමේ උත්සවයට ආශිර්වාද කළ නිසා, ස්තුති කරන්න.

**ජූනි:21 -** 2026 අප්‍රියෙල් මස 10වන දින පැවැති ශාන්ත පාවුලු මෙට්‍රිකියුලේෂන් පාසලේ වාර්ෂික දිනය සහ ළදරු පාසල් උපාධි ප්‍රධානෝත්සවයට අශිර්වාද කළ නිසා, ස්තුති කරන්න.

**ජූනි:22-** අපට නන් අයුරින් උපකාර කළ අය නිසා සහ අපගේ ප්‍රධාන සභාවේ සහ ශාඛා සභාවන්වල නායකයින්ට හා ඇදහිලිවන්තයින්ට ආශිර්වාද කළ නිසා, ස්තුති කරන්න.

**ජූනි:23 -** 2025 -2026 අධ්‍යයන වර්ෂය සාර්ථකව නිම කිරීමට අපගේ ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලට සහ සන්ධ්‍යා නෙහෙමියා බයිබල් විද්‍යාලයට ආශිර්වාද කළ නිසා, ස්තුති කරන්න.

**ජූනි:24-** අපගේ ප්‍රධාන සභාවේ සහ ශාඛා සභාවන්වල පැවැත්වූ යේ නිවාඩු කාලීන බයිබල් පාසල් වලට ආශිර්වාද කළ නිසා, නිසා ස්තුති කරන්න.

**ජූනි:25-** අපගේ යාච්ඤා හවුල්කරුවන් දායක හවුල්කරුවන් ඇදහිල්ලේ හවුල්කරුවන් ජීවිත කාලය පුරා හවුල්කරුවන් මහා නියෝගයේ හවුල්කරුවන්ට ආශිර්වාද කළ නිසා, ස්තුති කරන්න.

**ජූනි:26-** U-tube හරහා දෙමළ, තෙලිඟු, ඉංග්‍රීසි සහ හින්දි භාෂාවන්ගෙන් ප්‍රචාරණය වන පණිවිඩ වලට උන්වහන්සේගේ ආශිර්වාදය ලබා තිබෙන නිසා, ස්තුති කරන්න.

**ජූනි:27-** මේ දක්වා දේව සේවාවන් පවත්වාගෙන යාමට අප දැරූ සියලු උත්සාහයන් ඵලදායි කර තිබෙන නිසා, නිසා ස්තුති කරන්න

**ජූනි:28-** අපගේ කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වලට ආශිර්වාද කර ආරක්ෂා කර තිබෙන නිසා, නිසා ස්තුති කරන්න

**ජූනි:29 -** අපගේ තරුණ හා ළමා සේවයේ යහපත පිණිස අපගේ ගෝලීය දැක්මට ආශිර්වාද කර තිබෙන නිසා, ස්තුති කරන්න.

**ජූනි:30-** 2026 මැයි මස 16 වැනි දින නෙහෙමියා බයිබල් විද්‍යාලයේ ආදී ශිෂ්‍ය සැමරුමට ආශිර්වාද කළ නිසා, නිසා ස්තුති කරන්න,

**ජූලි:01-** ශ්‍රී ලංකා දේශයට දෙවියන් වහන්සේගේ කරුණාව හා ආශිර්වාදය ලැබී තිබෙන නිසා, ස්තුති කරන්න.

**ජූලි:02** ශ්‍රී ලංකා දේශය තුළ තිබෙන කිතුනු සභාව ආශිර්වාද කර බාධාවන් ඉවත් කර තිබෙන නිසා, ස්තුති කරන්න.

**ජූලි03-** ශ්‍රී ලංකා දේශය තුළ තිබෙන කිතුනු සභාව ආශිර්වාද කර බාධාවන් ඉවත් කර තිබෙන නිසා, ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**ජූලි:04-** ලොව පුරා ව්‍යාප්තව පවතින මාරාන්තික රෝග සහ මානසික අව පීඩනයන්ගෙන් පෙළෙන ජනතාවට සහනය ලැබෙන පිණිස, පිණිස යාච්ඤා කරන්න.

**ජූලි:05-** 2026 - 2027 අධ්‍යයන වර්ෂය සඳහා ශාන්ත පාවුලු මෙට්‍රිකියුලේෂන් පාසලට නවක සිසුන් ඇතුළත් කර ගැනීම පිණිස, පිණිස යාච්ඤා කරන්න.

**ජූලි:06-** 2026 - 2027 අධ්‍යයන වර්ෂය සඳහා අපගේ නේවාසික සහ සන්ධ්‍යා නෙහෙමියා බයිබල් විද්‍යාලයට සුදුසුකම් ලත් සිසුන් ඇතුළත් කර ගැනීම පිණිස, යාච්ඤා කරන්න.

**ජූලි:07-** යෞවනයින් හා දරුවන් වෙනුවෙන් යාච්ඤා කිරීම සඳහා වන ගෝලීය දැක්මට තවත් පුද්ගලයින් ඇතුළත් වන පිණිස, යාච්ඤා කරන්න.

**ජූලි:08-** අපගේ ජ්‍යේෂ්ඨ දේවගැති තුමා වන එස්. සැම් සෙල්ව රාජ් සහ ඔහුගේ පවුලේ සියලු දෙනාම සෑම නපුරෙන් ආරක්ෂා කරන පිණිස, යාච්ඤා කරන්න.

**ජූලි:09-** මෙම මාසය පුරාවටම අපගේ සියලු සේවාවන් වලට අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන ලබාදෙන පිණිස, යාච්ඤා කරන්න.

**ජූලි:10-** ලොව පුරා පවත්වනු ලැබූ නිවාඩු කාලීන බයිබල් පාසල් තුළින් ගැලවීම ලැබූ දරුවන් සහ තරුණ තරුණියන් උදෙසා, යාච්ඤා කරන්න.

**ජූලි:11 -** ලොව පුරා සිටින ළඟා නොවූ ජන කණ්ඩායම් වෙතට ප්‍රහාරාංශයක් රැගෙන යන මිෂනාරිවරුන්ට අවශ්‍ය දිව්‍ය ආරක්ෂාව ලැබෙන පිණිස, යාච්ඤා කරන්න.

**ජූලි:12-** මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වී සිටින පාසල් සහ විශ්ව විද්‍යාලවල සිටින සියලුම දරුවන් හා තරුණ තරුණියන් එයින් නිදහස්වන පිණිස, යාච්ඤා කරන්න.

**ජූලි:13 -** දරුවන් සහ යෞවනයන් ඇති දැඩි කිරීමේදී දෙමව්පියන්ට ඒ සඳහා අවශ්‍ය මඟ පෙන්වීම ලැබෙන පිණිස, යාච්ඤා කරන්න.

**ජූලි:14-** ලොව පුරා විසිරී තිබෙන සියලුම කිතුණු නිකායන් වල නව පිබිදීමක් ඇතිවෙන පිණිස, යාච්ඤා කරන්න.

**ජූලි:15--** ලොව පුරා පවතින යුද ගැටුම් අවසන් වී සියල්ලන්ටම සාමය ලැබෙන පිණිස, යාච්ඤා කරන්න.

**ජූලි:16--** ශ්‍රී ලංකා දේශීය තුළ පවතින අයහපත් කාලගුණ තත්ත්වයෙන් සියලු ජනතාව ආරක්ෂා කරන පිණිස, යාච්ඤා කරන්න.

**ජූලි:17--** ශ්‍රී ලංකා දේශය පාලනය කරන පාලකයින්ට අවශ්‍ය දිව්‍ය මඟපෙන්වීම ලබාදෙන පිණිස, යාච්ඤා කරන්න.

**ජූලි:18--** ශ්‍රී ලංකා දේශය තුළ වැටී තිබෙන ආර්ථිකය, සෞඛ්‍ය හා අධ්‍යාපනය නගා සිටුවන පිණිස, යාච්ඤා කරන්න.

**ජූලි:19--** ශ්‍රී ලංකා දේශයේ තිබෙන කිතුනු සභාව නව පිබිදීමක් ඇතුව ගමන් කරන පිණිස යාච්ඤා කරන්න.

....Contd. from page 4

## 3). දෙවියන් වහන්සේ මිනිස් තීරණ අභිබවා යයි!

ප්‍රිය දෙවියන් වහන්සේගේ දරුවෙනි, මිනිසුන් මගේ ජීවිතය සම්බන්ධයෙන් බොහෝ සැලසුම් කළ හැකි නමුත් සෑම මිනිස් තීරණයක්ම අභිබවා යාමට දෙවියන් වහන්සේට බලය ඇත.

යාකොබ්ගේ ජීවිතයට, ලාබාන් නැවත නැවතත් කොන්දේසි වෙනස් කරනු ලැබුවේය. නමුත් එම වේලාවේදී දෙවියන්වහන්සේ ප්‍රතිඵලය වෙනස් කරනු ලැබීය.

දෙවියන්වහන්සේ යාකොබ්ගේ ජීවිතය තුළ එය ඉටුකළා නම්, උන්වහන්සේට එය ඔබ වෙනුවෙන්ද කළ හැකිය.

ඔබට විරුද්ධව ක්‍රියා කරන තත්ත්වයන් තිබිය හැකිය:
විනිශ්චයක්
රෝග විනිශ්චයක්
විභාග ප්‍රතිඵලයක්
අන් අය විසින් කරන ලද තීරණයක්
එහෙමුත් දෙවියන්වහන්සේට ඒ සියල්ල අභිබවා යා හැකිය.


We need to come before Him and pray

අප කළ යුත්තේ උන්වහන්සේ ඉදිරියට පැමිණ යාච්ඤා කිරීම පමණි.
ස්වාමිනි, ඔබ මාගේ පියාණෝය. මම ඔබගේ දරුවාය, කරුණාකර මට උදව් කරන්න."

අප නිහතමානී වී අපගේ පාපයන් ගැන පාපොච්චාරණය කර උන්වහන්සේගේ උපකාරය ඉල්ලා සිටින විට උන්වහන්සේ ඉතා දයාවෙන් හා බලයෙන් යුක්තව අපට ප්‍රතිචාර දක්වන සේක.

උන්වහන්සේ විවෘත කරන දේ කිසිවෙකුට වසා දැමිය නොහැකි අතර උන්වහන්සේ වසන දේ කිසිවෙකුට විවෘත කිරීමටද නොහැකිය. *(එළිදරව් 3:7)*

මනුෂ්‍ය ආධිපත්‍යය සත්‍ය නමුත් දෙවියන්වහන්සේගේ පරමාධිපත්‍යය අවසානයයි.

## 4). දෙවියන් වහන්සේ සෑම අයුක්තියක්ම වැඩි කිරීමක් බවට පත් කරයි!



සමහර විට අප විශ්වාසවන්තව ජීවත් වුවත් ජීවිතය අසාධාරණ ලෙස අපට පෙනෙන්නට පුළුවන. පුදුමයට පත්විය හැකිය.

මම දෙවියන් වහන්සේට භය වෙමි. අනිත් අය තරම් මා ආශීර්වාද ලත් කෙනෙක් නොවන්නේ ඇයි?
දෙවියන් වහන්සේව නොසලකා හරින අය සමෘද්ධිමත් වන බව පෙනෙන්නේ ඇයි?

ධර්මිෂ්ඨව ජීවත්වීමෙන් යම් වටිනාකමක් තිබේද? ආදරණීය මිත්‍රවරුනි, ලෝකයේ සමෘද්ධිමත් ලෙස පෙනෙන දේ බොහෝවිට තාවකාලිකයි . නමුත් ඔබ මුහුණ දෙන සෑම අසාධාරණයක්ම දෙවියන්වහන්සේ එය ඔබට ශක්තිමත් කිරීමට වැඩි කිරීමට සහ උසස් කිරීමට භාවිතා කරනු ඇත.

*යාකොබ් දෙස බලන්න:*

ලාබාන්; තිත් සහිතය කියා පැවසූ විට දෙවියන්වහන්සේ බැටළුවන්ව තිත් සහිත කළේය. ඔහු ඉරි සහිත යැයි පැවසූ විට දෙවියන්වහන්සේ ඔවුන්ව ඉරි සහිත කළේය. ලාබාන් ඔහුට වංචා කළ තරමටම දෙවියන්වහන්සේ ඔහුව සමෘද්ධිමත් කළේය.


When Laban said 'speckled,' God made the flocks speckled.

*"තවද දෙවියන් වහන්සේට ප්‍රේම කරන්නන්ට, එනම් උන්වහන්සේගේ අභිප්‍රාය ලෙස කැඳවනු ලැබූවන්ට සියලු දේම යහපත පිණිස එකට ක්‍රියාකරන බව අපි දනිමුව." (රෝම 8:28)*

අයුක්තිය පවා දෙවියන්වහන්සේගේ හස්තයෙහි මෙවලමක් බවට පත්වේ.

ඔබට හිරිහැර කරන්නන්ට භය නොවන්න.

ඔබට වැරදි කරන අය නිසා අධෛර්යමත් නොවන්න.

සතුරා නපුරට අදහස් කරන දේ දෙවියන්වහන්සේ ආශීර්වාදයක් බවට පත් කරනු ඇත.

උන්වහන්සේව අල්ලාගෙන සිටින්න - උන්වහන්සේ සෑම අයුක්තියක්ම වැඩි කරන සේක.

## 5).දෙවියන් වහන්සේ ඔබව ඒ වෙතට ගෙනයන විට උන්වහන්සේ ඔබව ඒ හරහා ගෙන යනු ඇත!

යාකොබ් තම පියාගේ නිවසෙන් පිටත්ව ගොස් තම ජීවිතය බේරා ගැනීමට පලා ගිය විටදී ඔහු දෙවියන්වහන්සේගේ පොරොන්දුවක් හැර අන් කිසිවක් රැගෙන නොගියේය.

*'මම නුඹේ පිය වූ ආබ්‍රහම්ගේ දෙවි වූ ............ ස්වාමීන් වහන්සේය. නුඹ නිදා සිටින දේශය නුඹටද නුඹේ වංශයටද වංශයටද දෙන්නෙමි." (උත්පත්ති 28:13)*

ඔහු හිස් අතින් ගියේය. ඔහුගේ අනාගතය ගැන බියෙන් සහ ජීවිතය ගැන අවිනිශ්චිතව ගමන් කළේය.



***I am the Lord… I will give you and your descendants this land …***

මුලදී ලාබාන්ගේ නිවසේ ජීවිතය යහපත් බවක් පෙනෙන්නට තිබුණත් කාලයත් සමග එය සතුරුකමක් බවට පත්විය. ලාබාන් සහ ඔහුගේ පුතුයෝ ඊර්ෂ්‍යයා කළ අතර ඔවුන්ගේ ආකල්පයද වෙනස් විය.

*''ලාබාන්ගේ මුහුණ තමා කෙරෙහි ඉස්සර වාගේ ප්‍රිය නැති බව යාකොබ් දුටුවේය ......... තුඹලාගේ පියාගේ මුහුණ මා කෙරෙහි පළමු ලෙස නොවන බව මට පෙනේ ........" (උත්පත්ති 31:2,5)*

යාකොබ්ට කරදර වූවත් දෙවියන් වහන්සේ ඔහු සමග සිටියේය.

කාලය පැමිණි විටදී, 'නැවත පැමිණෙන්න' කියා දෙවියන්වහන්සේ පැවසුවේය.

ලාබාන් යාකොබ්ව හිස් අතින් යැවීමට අදහස් කළ විටදී පවා දෙවියන් වහන්සේ ඔහු වෙනුවෙන් මැදිහත් විය.

*යාකොබ් සාක්ෂි දුන්නේ;*

*''....මාගේ පියාගේ දෙවියන් වහන්සේ මා සමග නොසිටි සේක් නම් සැබවින් තුඹ මා හිස් අතින් යන්ට හරිනවා ඇත........" (උත්පත්ති 31:42)*

නමුත් දෙවියන් වහන්සේට ඉඩ දුන්නේ නැත. උන්වහන්සේ සියල්ල යථා තත්ත්වයට පත්කර පොරොන්දුව ඉටු කළේය.දෙවියන්වහන්සේ උන්වහන්සේගේ කාලය තුළ සියල්ල අලංකාර කරයි.

ඔබ බලා සිටින්නේ නම්:

උසස් වීමක් සඳහා
ප්‍රගතිය සඳහා
ඉදිරි ගමනක් සඳහා

දෙවියන්වහන්සේ ඔබට මඟක් කර දෙයි:

'කාලය දැන්ය' කියා දෙවියන් වහන්සේ පවසන විට කිසිවෙකුටවත් ඔබව වැළැක්වීමට නොහැකිය.

නිර්භීත වෙන්න
ශක්තිමත් වෙන්න

නියම වේලාවට දෙවියන්වහන්සේ ඊළඟ දොර විවෘත කරයි.

ප්‍රිය මිතුවරුනි මිනිසුන් අපට විරුද්ධව කුමන්ත්‍රණය කළ හැකි අතර සතුරා අප ඉදිරියේ බේද්වාවකයක් ඇති කිරීමට හැකි මුත් දෙවියන්වහන්සේ කිසිවිටකවත් ඔවුන්ට අපව විනාශ කිරීමට ඉඩ නොදෙයි.

අප උන්වහන්සේගේ පොරොන්දුව තදින් අල්ලාගෙන සිටිය යුතුයි.

*''තුඹට විරුද්ධව නැගිටින්නා වූ තුඹේ සතුරන් ස්වාමීන් වහන්සේ තුඹ ඉදිරියෙහි පරාජය වෙන්ට සලස්වන සේක." (ද්විතීය කතාව 28:7)*

අප කුමන ප්‍රශ්නයකට මුහුණ දෙනු ලැබුවත් දෙවියන් වහන්සේ අප සමග සිට ගනී. උන්වහන්සේගේ වචනය අපට මඟක් මඟක් කර දෙන්නේ:

*''ධර්මිෂ්ඨයාගේ පීඩා බොහෝය. නමුත් ස්වාමීන්වහන්සේ ඒ සියල්ලෙන් ඔහු ගලවන සේක." (ගීතාවලිය 34:19)*

*''ඔහු මට යාච්ඤා කරන්නේය, මමද උත්තර දෙන්නෙමි; දුකෙහිදී ඔහු සමග සිටින්නෙමි.'' (ගීතාවලිය 91:15)*

....Contd. to page 10

NEHEMIAH BIBLE COLLEGES,
Chepauk & Santhoshapuram, Velachery Chennai.
Rush for admission!
Medium :Tamil (Part Time)
Hindi (Residential) (Sponsorship Available)
Diploma in Theology &
Bachelor of Theology
Qualification :
10th Standard & above
Contact :
The Chairman, Nehemiah Bible College.
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org
Recognised by
International Christian Leaders &
Senior Pastors for the past 56 years



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

**''...කියවන්නා තේරුම් ගනීවා....''** *(මතෙව් 24:15)*

### ''එහෙත් මාගේ මිදුම්කාරයාණන් ජීවත්ව සිටින බවද ....දනිමි'' (යෝබ් 19:25)

මගේ දේව සේවයේ මුල් කාලවකවානුවේදී දෙවියන්වහන්සේ බොහෝ පරීක්ෂාවන් හා දුෂ්කරතාවයන් තුලින් යාමට මා හට ඉඩ දුන්නේය. මට තිබූ මූල්‍යම අවශ්‍යතා නිසා මා දැඩි පීඩනයකටද මුහුණ දුන්නෙමි. මගේ සේවය පවත්වාගෙන යාමට ගොඩනැගිල්ලක් ලබා ගැනීමට මා හට හැකියාවක් නොතිබුණි. විටින් විට මගේ නිවස සහ කාර්යාලය විවිධ ස්ථානවලට ගෙනයාමට සිදුවිය.



1980 වැනි වසරේදී මා තදබල ලෙස රෝගාතුරු විය. දින ගණනාවක් පුරාවටම උණ රෝගයෙන් හා ශාරීරික ලෙස බොහෝ වේදනාවෙන් පෙළුණු අතර මගේ බෙල්ලේ ද දැඩි වේදනාවක් තිබුණි. මා සේවය කළ ස්ථානය කිතුණු ප්‍රදේශයක් නොවුන නිසා මා අවට සිටි පුද්ගලයින්ගෙන් මට කිසිදු උදව්වක් හෝ උපකාරයක් ලැබුණේ නැත. එබැවින් මම ආගන්තුකයෙකු ලෙස සලකනු ලැබුවේය. මා රෝගාතුරුව තනිව සිටි නිසා මා ශාරීරිකව ලෙස බොහෝ දුක් වින්දෙමි. එක් දිනක් රාත්‍රියක මගේ මිතුරෙකුගෙන් මා සමග රැදී සිටින ලෙස ඉල්ලා සිටියෙමි. මීට පෙර මා ඔහුට බොහෝ උපකාර කර තිබුණි. නමුත් ඔහු මා සමග සිටීම ප්‍රතික්ෂේප කළේය. එදින රාත්‍රියේ මා ශාරීරික ලෙස බොහෝ දුක් වින්දෙමි.

පසුදින උදෑසන මිනුෂයන් කිප දෙනෙක් පැමිණි මාව රජයේ රෝහලට ඇතුළත් කර තනිවම දමා ගියේය. මා එම රෝගයෙන් පීඩා විදිමින් සිටියෙමි. දින ගණනාවකට පසුව වෛද්‍යවරු මට සැත්කමක් කිරීමට අවශ්‍යයි කියා තීරණය කළ අතර ඒ වන විටදීත් මා රෝගයෙන් පීඩා විදිමින් සිටියෙමි. දින ගණනාවකට පසුව වෛද්‍යවරු මට සැත්කමක් කිරීමට අවශ්‍යයි කියා තීරණය කළ අතර මගේ තත්වය අනුව සියලු කටයුතු සූදානම් කළහ. සැත්කමට භාජනය වීමට මා හට අවශ්‍ය නොවිය. එබැවින් මම දෙවියන්වහන්සේට යාච්ඤා කිරීමට පටන් ගත්තෙමි. නමුත් මට ලෞකික සැප පහසුකම් සඳහා මාර්ග තිබුණද දේව සේවය වෙනුවෙන් මම බොහෝ ගැටලු වලට මුහුණ දුන් ආකාරය ගැන මා දෙවියන්වහන්සේට



පැවසුවෙමු. මම මගේ මාර්ග උන්වහන්සේට පැහැදිලි කළ විට *''...මාගේ මාර්ග කියා දුනිමි, ඔබ මට උත්තර දුන් සේක ..'' (ගීතාවලිය 119:26)*

එක් දිනක් රාත්‍රියේදී මා යාච්ඤා කරමින් සිටින විට දෙවියන් වහන්සේගේ ස්පර්ශය මට දැනුනි. මගේ ශරීරය තුළ තිබුණා වූ සියලු රෝග වලින් නිදහස් වෙන බව මට දැනුණි.

මම එය සම්පූර්ණයෙන්ම විශ්වාස කළ අතර මගේ අත්දැකීම ගැන අදාල වෛද්‍යවරයාටද දැනුම් දුන්නෙමි. ඔහු අනුකම්පා සහගතව මට පවසනු ලැබුවේ; ''මම දන්නවා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සුව කළා කියා ප්‍රතිකාර ගන්න එක ප්‍රතික්ෂේප කරන බොහෝ කිතුනුවන් ඉන්නවා කියලා ඔබත් ඒ දේම පවසනවා''.



පසුව කිසිම සැත්කමක් හෝ ඖෂධයක් නොමැතිව වෛද්‍යවරයා මාව දමා ගියේය. දෙවියන් වහන්සේ තුළ මා විශ්වාස කළ දෙය උන්වහන්සේ මගේ ජීවිතයෙහි ඉෂ්ට කළේය.

දෙවියන් වහන්සේ මාව සම්පූර්ණයෙන්ම සුවපත් කර දැනට වසර 46ක් ගතවී තිබේ. එනමුත් එම කිසිදු ආසාදනයක් නැවතත් මගේ ජීවිතය ස්පර්ශ කළේ නැත. මම රළු මාර්ගවල ගමන් කළ අතර රළු මාවත්වල වාහනය පැදවීමට සිදුවුවද මගේ බෙල්ලේ පිටුපස තිබූ වේදනාව මට කිසිවිටක දැනුනේ නැත. මම දිනකට පැය 20ක් පමණ වැඩ කළෙමි.එසේම මගේ කාර්යාලයේ හෝ වෙනත් ස්ථානවලට ගොස් දේශනා කරනු ලැබුවත් මා වෙහෙසට පත් වූයේ නැත. දෙවියන්වහන්සේ මාව සම්පූර්ණයෙන්ම සුවපත් කළා පමණක් නොව විවිධ ආකාරවලින් මට ආශීර්වාද කර තිබේ.

# MAIN CHURCH PROGRAMMES

1. Prayer Service : 24 hours
2. **ECHO OF HIS CALL** - Monthly Magazines :English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikaans.
3. **BIBLECOR -** Basic Bible Courses (English, Tamil & Hindi)
4. Theological Correspondence Courses: English & Tamil
5. Nehemiah Bible Colleges (Chepauk, Santhoshapuram & Velachery)
6. Branch Churches: Santhoshapuram, Balaji Nagar & Velachery
7. Great Commission Partners (Network of Pastors)
8. Training Programmes – Seminars & Retreats
9. Crusades
10. Literature Distribution and Follow Up
11. Gospel Printing Press - Publications
12. St. Paul's Matriculation School - Village English High School
13. Sunday Schools (Chepauk) : 10.30 a.m. Sunday & (Velachery, Balaji Nagar & Santhoshapuram) 3.00 p.m. Sunday
14. **Early Morning Service : 5.30 a.m. Sunday**
15. **Preliminary Service : 8.00 a.m. Sunday**
16. **Tamil Service : 8.30 a.m. Sunday**
17. **Youth Meeting : 11.00 a.m. Sunday**
18. **Fellowship Lunch : 1.00 p.m. Sunday**
19. **Telugu Service : 4.00 p.m. Sunday**
20. **Hindi Service : 5.00 p.m. Sunday**
21. **Tamil & English Service : 6.00 p.m. Sunday**
22. Feedback Time : 7.30 p.m. Sunday
23. Women's Prayer : 5.30 p.m. Wednesday
24. Hindi Prayer : 7.00 p.m. Wednesday
25. Men's Prayer : 7.30 p.m. Friday
26. Discipleship Meeting : 6.00 p.m. Saturday
27. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
28. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
29. Ministers' Meeting : 5.30 p.m. First Saturday
30. Parents' Prayer : 4.00 p.m. First Sunday
31. Night Prayer : 9.30 p.m. Third Friday
32. Fasting Prayer : 9:30 a.m. Second Saturday
33. Holy Communion : Second Sunday Service
34. Youth / Kid Prayer : 10.00 p.m. daily (over phone)
35. Staff Devotion : 9.00 a.m. daily
36. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

මාව අතහැර දැමූ එක් මිතුරෙක් සිටිය නමුත් අද දෙවියන්වහන්සේ ලොව පුරා බොහෝ මිතුරන් මට ලබාදී ඇති අතර මට සහ මගේ සේවයට බොහෝ සේ ආශිර්වාද කර ඇත.

ප්‍රිය මිතුය, අපගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඉතා අද්විතීය වන අතර සියල්ලටම වඩා උසස්ය. උන්වහන්සේ අපගේ සැබෑ මිතුරා සහ දෙවියන්වහන්සේ ලෙස සලකන්නේ නම්, උන්වහන්සේ මේ අඳුරු ලෝකය තුළ නියම වේලාවට අපව නිවැරදි මාවත වෙතට ගෙන යනු ඇත. ඔබගේ පෞද්ගලික ජීවිතයේදී උන්වහන්සේව ඔබගේ ස්වාමියා සහ ගැලවුම්කාරයා ලෙස පිළිගෙන නොමැති නම්; දැන්ම උන්වහන්සේව



පිළිගෙන උන්වහන්සේට සේවය කිරීමට ආරම්භ කරන්න. උන්වහන්සේ නිසැකවම ඔබව ආරක්ෂිත ආකාරයකින් ගෙනයනු ඇත. උන්වහන්සේ මාව දිනපතා මෙහෙයවන ආකාරයටම උන්වහන්සේ ඔබටත් මග පෙන්වනු ඇතැයි මා විශ්වාස කරමි.

*"...මම කාන්තාරයෙහි පවා මාර්ගයක්ද වනයෙහි ගංගාද සාදන්නෙමි." (යෙසායා 43:19)*

*************

Posted at "Egmore RMS Patrika Channel" RNI NO. TN/SIH/2006/17846

*....Contd. from page 7*

දෙවියන් වහන්සේ දුරස්ව නොමැත - උන්වහන්සේ අප සමඟයි. උන්වහන්සේ සෑම පරීක්ෂාවකදීම අප අසලින්ම ගමන් කරයි.

උන්වහන්සේ ඔබව අත්හරින්නේ නැත.
උන්වහන්සේ ඔබව අසමත් කරන්නේ නැත.

උන්වහන්සේ ඔබ වෙනුවෙන් සූදානම් කර ඇති ඉරනම විනාශ කිරීමට කිසිවෙකුටවත් ඉඩ නොදෙනු ඇත.

උන්වහන්සේගේ පොරොන්දුව තදින් අල්ලාගෙන සිටින්න.

*''....ආබ්‍රහම් භය නොවෙන්න; නුඹේ පලිහ ද නුඹේ ඉතා මහත් විපාකයද මමයි කී සේක." (උත්පත්ති 15:1) (ඔබගේ නම එහි යොදන්න - උන්වහන්සේගේ පොරොන්දුව පුද්ගලිකයි)*

ආශිර්වාදමත් මාසයක් වේවා!

*************

## NOTICE

Save our mobile numbers (+91) 98410 71858, (+91) 98412 71858 (main numbers) in your mobile phones.

- Editor

# ECHO OF HIS CALL

Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.

Annual Subscription : Rs. 100/- Life Subscription : Rs. 2000/-

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps (**Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.**) to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :
ECHO OF HIS CALL
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.org

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS Patrika Channel"**
**on 2nd JUNE 2026.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

To

*GOD BLESS YOU!*

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**